# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2360/63 – 2023 දෙසැම්බර් මස 01 වැනි සිකුරාදා – 2023.12.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 9/2005(III) A

**2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත**

26 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන නියමය

සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරීන් ප්‍රනාන්දු වන මම, 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත මෙහි පහත උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශ, සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

නාලක ජූඩ් හරීන් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹුල්ල - 445, පැල්වෙහෙර - 450A, ඉනාමලුව - 451, දිගම්පතන - 453A, අවුඩංගාව - 453, නාගල වැව- 453B, රත්මල්ගහඇල - 445A, යකුරාගල උතුර - 446A, විල්හත - 446F,පහළ ඇරැවුල - 446, කණ්ඩලම - 449, කුඹුක්කඳවන්වල - 448, සීගිරිය -445, කිඹිස්ස - 452A, පලුටාව - 452, පොතාන -452C, පිදුරංගල- 455C, තල්කොටේ - 455A, වැවල වැව - 447A, නිකවටන - 447 යන ග්‍රාම නිලධාරී වසම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් දහසය දහස් හාරසිය පනහකින් ( හෙක්. 16, 450) සමන්විත වූ භූමි ප්‍රදේශය.

EOG 12 - 0013


1A – PG6545 – 381(2023/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*